# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/28 - 2018 සැප්තැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2018.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

49 ''ඒ'' වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තිය සමඟ කියැවෙන ඉඩම, අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 49 ''ඒ'' වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, මලික් සමරවික්‍රම වන ම විසින් 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති ඉඩම අවශ්‍ය බව මෙම නියෝගයෙන් ප්‍රකාශ කර සිටිමි.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ගම ග්‍රාමයෙහි, බලයලත් මිනින්දෝරු, ජේ. පී. එන්. ජයසුන්දර මහතා විසින් 2017.10.19 දින මැන පිළියෙල කරන ලද අංක : 14042 A දරන සැලැස්මේ කැබලි අංක : A මගින් පෙන්නුම් කරන, අලුවින්නේ කුඹුර සහ කිඩේඉස්මත්ත නැමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6617 (අක්. 04, රූඩ් 0, පර්. 17) ක් වූ ඉඩම් කොටස් සඳහා මායිම් පහත පරිදි වේ. (දළ සටහන අමුණා ඇත.)

කැබලි අංක : A

| | | |
|---|---|---|
| උතුරට | : | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම (PP ගම් 116 හි කැබලි අංක : 83, 81 හා 80) ; |
| නැගෙනහිරට | : | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම (PP ගම් 116 හි කැබලි අංක : 81, 80 හා 79) ; |
| දකුණට | : | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම (PP ගම් 116 හි කැබලි අංක : 85 හා 84 හි ඉතිරි බිම් කොටස්) මාර්ගය සහ ඩයනා වොෂ් (පුද්) සමාගමට අයත් ඉඩම ; |
| බස්නාහිරට | : | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම (PP ගම් 116 හි කැබලි අංක : 85 හා 84 හි ඉතිරි බිම් කොටස්) පිඹුරු පත් අංක 14042 හි කැබලි අංක : B සහ ඩයනා වොෂ් (පුද්) සමාගමට අයත් ඉඩම. |

ප්‍රමාණය : හෙක්ටයාර් 1.6617 (අක්. 04, රූඩ් 0, පර්. 17)

09 - 512


1A - G 28458 — 37 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*